# ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා)

## අබලි භාණ්ඩ ඉවත් කිරීම සඳහා මිල ගණන් කැඳවීම

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයට අයත් පාවිච්චියෙන් ඉවත් කරන ලද පහත සඳහන් අබලි භාණ්ඩ ඉවත් කිරීම සඳහා මිල ගණන් කැඳවනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. මෝටර් රථ කොටස් - ලොට් 01
2. ටයර් - ලොට් 01
3. කාර්යාලීය පුටු - ලොට් 01
4. ඉවත්කරන ලද වායු සමීකරණ යන්ත්‍ර- ලොට් 01

## මිලදී ගනු ලබන භාණ්ඩ පරීක්ෂා කර බලා ලංසු ඉදිරිපත් කිරීම

***2022.12.06 දින සිට 2022.12.19 දින දක්වා කාර්යාලීය දිනයන්හි පෙ. ව. 09.00 සිට ප. ව. 04.00 දක්වාත්, 2022.12.20 වන දින පෙ. ව. 09.00 සිට ප. ව. 02.00 දක්වාත් සිදුකළ හැකිය.***

## ලංසු විවෘත කිරීම 2022.12.20 වන දින ප.ව. 02.00 සිදු කරනු ලැබේ.

**( ඉහත කාලය තුලදී ටෙන්ඩර්පත් මුදල් අංශය මඟින් රු.250ක මුදලක් ගෙවා ලබා ගත හැකිය)**

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය

2022 දෙසැම්බර් මස 05 වැනි දින,
ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය
කාක දූපත, මට්ටක්කුලිය,
කොළඹ - 15

# ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා)

## මිල කැඳවුම් පත් අංකය: NARA/FIN/Scrap/2022-01

නාරා ආයතනයේ පරිහරණයෙන් ඉවත් කරන ලද අබලි භාණ්ඩ ඉවත් කිරීම සඳහා මිල ගණන් කැඳවීම

01. නාරා ආයතනයේ පරිහරණයෙන් ඉවත් කරන ලද අබලි භාණ්ඩ ඉවත් කිරීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් 2022.12.20 වන දින ප.ව. 02.00 දක්වා සභාපති, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය, කාක දූපත, මට්ටක්කුලිය, කොළඹ 15 විසින් කැඳවනු ලැබේ.

02. අබලි ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සඳහා 2022.12.06 දින සිට 2022.12.19 දින දක්වා කාර්යාලීය දිනයන්හි පෙ. ව. 09.00 සිට ප. ව. 04.00 දක්වාත්, 2022.12.20 වන දින පෙ. ව. 09.00 සිට ප. ව. 01.00 දක්වාත් සිදු කරන අතර එම කාලය තුලදී ටෙන්ඩර් පත්‍රිකා මුදල් අංශය මඟින් නිකුත් කරනු ලැබේ.

03. අදාළ මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රිකා රු. 250.00ක ආපසු නොගෙවනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසු මුදල් අංශය වෙතින් ලබාගත හැක.

04. මුද්‍රා තැබූ නිසි පරිදි පුරවන ලද පත්‍රිකා 2022.12.20 වන දින ප.ව. 01.55ට පෙර මුදල් අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කල යුතුය. මිල ගණන් විවෘත කිරීම 2022.12.20 වන දින ප. ව. 02.00ට නාරා ආයතනයේ මුදල් අංශය පරිශ්‍රයේදී සිදු කරනු ලැබේ. ඒම අවස්ථාවට මිල ගණන් ඉදිරිපත් කළ අයටද සහභාගී විය හැක.

05. මිල ගණන් විවෘත කිරීමෙන් පසුව තෝරා ගනු ලැබූ අයට දැනුම් දෙනු ලබන අතර එසේ දැනුම් දීමෙන් පසු ඔවුන් විසින් නියමිත මුදල නාරා ආයතනයේ මුදල් භාරකරු වෙත මුදලින් ගෙවා රිසිට් පතක් ලබා ගත යුතුය.

06. තෝරාගත් අය විසින් අදාල මුදල් ගෙවා වහාම අදාල භාණ්ඩ ඉවත් කරගත යුතුය. එසේ ඉවත් කර නොගත් භාණ්ඩ පිළිබඳව ආයතනය විසින් වග කියනු නොලැබේ.

07. මිල කැඳවුම් පත්‍රයේ සඳහන් ලොට් අංකයක් සඳහා ඒ ඉදිරිපස ඇති කොටුවේ මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. ( ලොට් අංක 01 සිට 04 දක්වා )

08. මිල කැඳවුම් පත්‍රයෙහි සඳහන් අයිතම මිල ගණන් ඉදිරිපත් කළ අයට ලබාදීම, මිල ගණන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය නාරා ආයතනයේ කළමණාකාරීත්වය සතුය.

09. තෝරා ගනු ලැබූ අයට පිරිනමන ලද භාණ්ඩ ඉවත් කර ගැනීම ඉල්ලුම්කරුවන්ගේ වියදමින් සිදු කළ යුතු අතර, ආයතනය විසින් මේ සම්බන්ධව කිසිවක් කිරීමට බැඳී නොසිටී.

10. ගැණුම්කරුවන් තෝරා ගනු ලබන්නේ ඉදිරිපත් කර ඇති උපරිම මිල ගණන් වලට අනුවය. මිල ගණන් සඳහන් කළයුතු ආකාරය පිළිබඳව මිල කැඳවුම්පතෙහි අදාල ලොට් අංකයන්ට පහතින් සඳහන් කර ඇත.

11. භාණ්ඩ ඉල්ලුම්කරු මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ලියවිල්ල සම්පූර්ණයෙන් පුරවා එවිය යුතු අතර අසම්පූර්ණ ඇපැහැදිලි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය
කාක දූපත, මට්ටක්කුලිය,
කොළඹ - 15